# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2197/16 – 2020 ඔක්තෝබර් 14 වැනි බදාදා – 2020.10.14**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/01/2019/170.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4 (1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

ලංකා කම්කරු කොංග්‍රසය, (පී. සීතාදේවී වෙනුවෙන්) 28බී/15, පාදුක්ක පාර, ඉංගිරිය.

සහ

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව, 21, බීසීසී පරිශ්‍රය, මිරානියා වීදිය, කොළඹ 12.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, මාලඹේ, කහන්තොට, මල්වත්ත පාර, 224/14ඒ, කේ. ඒ. පියරත්න මයා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**නිමල් සිරිපාල ද සිල්වා,**
කම්කරු අමාත්‍ය.

2020 ඔක්තෝබර් මස 12 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/01/2019/170.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

ලංකා කම්කරු කොංග්‍රසය, (පී. සීතාදේවී වෙනුවෙන්) 28බී/15, පාදුක්ක පාර, ඉංගිරිය.

සහ

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව, 21, බීසීසී පරිශ්‍රය, මිරානියා වීදිය, කොළඹ 12.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

''ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට අයත් හොරණ පර්ත් වත්තේ සේවය කළ පී. සීතාදේවී මහත්මියගේ සේවය අවසන් කිරීම වෙනුවෙන් රුපියල් 260,000 ක වන්දි මුදලක් ලබාදීමේ ලිඛිත එකඟතාවයක් ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව විසින් ලබා දී තිබුන ද එම වන්දි මුදල ඇයට ලබා නොදී 2017.12.31 වන දින සිට ඇයගේ සේවය අවසන් කිරීමෙන් අසාධාරණයක් සිදුව තිබේ ද? යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඇයට හිමිවිය යුතු සහන කවරේ ද? යන්න පිළිබඳව වේ.

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2020 මාර්තු මස 10 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.
10 - 1090

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.